# නවීන විද්‍යාවට කිසිදා යට නොවෙන මිනිස් සිත ගැන සිතා බලමු

කාලයෙන් කාලයට නවක නිපැයුම් බිහි වීම ලොවෙහි සිරිත යැ. ඇතැම් නිපැයුමක් කරළියට එන විටැ, එතෙක් පැවැති කිසියම් නිපැයුමක් කාලයට නො ගැලැපී ඉවත් වීම ද ලොවෙහි සිරිතක් සේ මැ සිදු වෙයි. මේ අනුවැ එක පරපුරක් දැකැ ගත් දේ පසු වැ එන පරපුර මඟින් නො දකියි. මෙම ලෝ දහම අනුවැ ආපසු හැරී බලන විටැ, එදා මිනිසා නොදුටු කොපමණ දේ අද සිටින මිනිසුන් වන අප දැකැ ගන්නවා ද?

මගේ පාසල් සමය ගැන සිත යොදවා බලන විටැ, එකලැ කෙනෙකු ගේ ඉතිරි කිරීමේ ගිණුමෙකින් මුදලක් ආපසු ගන්නට ඇවැසි වූ විටැ, පැවැති එක මැ ක්‍රමය වූයේ තැපැල් කම්දොරුවට ගොස්, තම වාරය පැමිණි පසු ඉදිරිපත් වී, ගිණුම් පොත සමග ලිඛිත අයදුම් පත භාර දී මුදල ලබා ගැනීමයි.

අද එම දෙය කර ගැනීමට කිසිවෙකු ගේ සහාය පැතියැ යුතු නැත. ඕනෑ දුර-බැහැරෙකැ යන ගමන් 'ටෙලර්' මැසිමක් වෙතැ ළංවී, තමාට ඇවැසි මුදල මැසිම තුළින් තමා ගේ මැ අතට ලබා ගැනීමට ගත වනුයේ විනාඩියක් තරම් කෙටි කාලයෙකි. මෙ කලැ පෙරට, පැමිණ ඇති මෙ වැනි හාස්කම් තවත් කොතෙක් ද?

ගෙවී ගිය කාලය තුළැ මිනිසා අළුතින් සොයා ගත් දේ කො පමණදැයි කිව නොහැකි යැ. එම නව නිපැයුම් මිහිපිටැ, දිය යටැ මෙන් මැ ඈත ගගන තලෙයෙහි දේවල් බව පැහැදිලියැ. මිනිස් ඇසට නො පෙනෙන දේ විදුහුරු මෙවලම් තුළින් දැකැ ගන්නට මිනිසා සමත් වී සිටී.

එක් අතකින් මිනිසා විදුහුරු වැ කළ හැකි ක්‍රියාකාරකම් වැඩි දියුණු කරන අතරැ, අනික් අතින් පෙරැ සෙවූ බොහෝ දේ වනසා ලමින් ද සිටී. බාහිර සොයා ගැනීම් තුළින් පෙරට මැ යන අතරැ තම සිරුර පිළිබඳවැ ද අපමණ නව නිපැයුම් සොයා ගෙනැ තිබේ. එහෙත් අප දන්නා තරමට නම් මිනිසාට තමාගේ සිත හරිහැටි හඳුනා ගැනීමට තව මැ හැකි වී නැත. මිනිස් සිතෙකැ ඇති වෙන ඇලීම සහ ගැටීම පාලනය කිරීමට මිනිසා තව මැ අසමත් වැ සිටී.

මෙතැන දී පෙරට එන්නේ ගෝතම බුදුන් වහන්සේ පමණක් දුටු සිතෙහි බලවත් කමයි. සිත නිසා මැ ඇති වෙන උපත (සසර පැවැත්ම) සිත මැ යොදවා නිශේධ කළ යුතු බව බුදු හිමියෝ දැකැ ගත්හ. එය ක්‍රියාවට ද නඟා පෙන්වූහ.

නවීන විද්‍යාඥයා කො පමණ දේ දුටුවත් සිත පිළිබඳ වැ බුදු හිමියන් දුට දේ දැකැ ගන්නට තව මැ සමත් වී නැත. මෙතෙක් සිදු වී ඇති තත්වය සලකා බලන විටැ 'සිතට වෙදාණන්' වූ බුදු හිමි පරයා නැඟෙන නව නිපැයුමක් කිසි දා ඇති වේ යැයි සිතීමට පවා නො හැකි මැ යැ.

සැත්කම් (ශල්‍යකර්ම) වලදී සිහි නැති කිරීම සිත අක්‍රිය කිරීමකැයි බොහෝ දෙනා තුළ පිළිගැනීමක් තිබේ. එතැනදී සිදු වනුයේ සිතීම පිළිබඳ අක්‍රියතාවයක් නොව දැනීම (විඳීම) අක්‍රිය කිරීමක් බව මගේ පිළිගැනීමයි. 'නිර්වින්දනය' යන වදනෙහි නිසි අදහස වනුයේ ද වින්දනය නැති කිරීමයි.

බුදුනු ප්‍රතිපදාව තුළ පවතින 'සමවතට සමවැදීම' වඩාත් පැහැදිලි වැ මැ සිත අක්‍රිය කිරීම බව පිළිගත යුතු වැ තිබේ. එය නවීන විද්‍යාවෙන් මුළුමනින් මැ පරිබාහිර වූ ක්‍රියා දාමයකි.

*වෙසක් පොහොය සමයෙහි අසම-සම*
*බුදු ගුණ සිහි කරැ සිත නිවා ගනිමු*



*සිරිවිමල මුතුකුමාරණ*
ඩැන්ඩිනොං

## පාළි පාඨ හෙළ බසින් - 46

*"යථා පි රුචිරං පුප්ඵං*
*වණ්ණවන්තං අගන්ධකං*
*ඒවං සුභාසිතා වාචා*
*අඵලා හෝති අකුබ්බතෝ"*
*(ධම්මපද 51 - පුප්ඵ වග්ග)*

කැමැති මල්වලැ පවා
පැහැයැ'ති සුවඳ නැති සේ
දෙසු දහමෙහි ඒ ලෙසැ මැ
පල නැත පල නො ලද හොත්

*සිරිවිමල මුතුකුමාරණ*
ඩැන්ඩිනොං

For all your
Advertising needs
mihirie@pahana.com.au
Mihirie Dissanayake
0414 546 833

ඔබගේ සියලුම ජෝතිෂ්‍ය
කටයුතු සඳහා
ජන්ම පත්‍ර බැලීමට
නම් තැබීමට
සුභ නැකත් සෑදීමට
පොරොන්දම් බැලීමට
වැඩි විස්තර සඳහා අමතන්න
0419 874 469
or Email your details to
astrology@pahana.com.au

www.pahana.com.au